# අධ්‍යාපන ක්‍රියාවලිය තුළ විෂයමාලා සැලසුම්කරණයේ වැදගත්කම පිළිබඳ විමසුමක්

පූජ්‍ය කළුබෝවිටියන සෝරත හිමි

## ප්‍රවේශය

විෂයමාලාවක් යනු යම්කිසි රටක අනාගත පැවැත්ම සඳහා හේතුවන දරුවන්ගේ සංවර්ධනය සිදු කරන ප්‍රධාන ඒකකයකි. පාසල මූලික කරගෙන සිදුකරන විධිමත් විෂයමාලාව ප්‍රධාන වශයෙන් මෙහි දී අර්ථවත් කෙරේ. සෑම විෂයමාලාවක් ම යම්කිසි ආකෘතියක් මූලික කරගෙන සැලසුම් කොට සාර්ථක විෂයමාලාවක් බවට පත් කිරීම උදෙසා වෑයම් කරන ලද ඒවා ය. එම විෂයමාලාවන් ඇතැම් අවස්ථාවල දී කාලයෙන් කාලයට වෙනස් කිරීමට සමාජ අවශ්‍යතා අනුව සිදුවී ඇති බව පෙනේ. එලෙස සිදු කරන වෙනස් කම් රටෙහි අනාගත සංවර්ධනය උදෙසා හේතු සාධක වන විෂයමාලාවක් බවට පත් කිරීමට සමත් විය යුතු ය. නැතහොත් එය නිරර්ථක වූවක් බවට පත්විය හැකිය. එම නිසා විෂයමාලා සැකසීමට මත්තෙන් එය සැලසුම් කිරීම අනිවාර්යයෙන් සිදු කළ යුත්තකි.

සැලසුමකින් තොර වූ යම්කිසි කාර්යයක් වුව ද අරමුණු ඉටු කර ගැනීමට නො හැකි තත්ත්වයකට පත්විය හැකිය. නිවැරදි දිශානතියකින් තොරව ගමන් කරන කාර්යයක් බවට එය පත් විය හැකි ය. මෙහි දී සාකච්ඡාවට භාජනය කරනුයේ විෂයමාලාව යනු කුමක් ද යන්න හැඳින ගැනීමත් විෂයමාලා සැලසුම්කරණය යනු කුමක් ද එම සැලසුම්කරණය සිදු විය යුත්තේ කෙසේ ද යන්න සෝදාහරණ ව කරුණු ඉදිරිපත් කිරීමත් ය.

ඒ අනුව විෂයමාලාව යනු කුමක් ද, විෂයමාලා වර්ගීකරණයක් යන්න හඳුනා ගැනීමත්, විෂයමාලා සැලසුම්කරණය සිදු විය යුතු වූ ආකාරය ආකෘතිකමය වශයෙන් නිර්වචනානුකූල ව විමසීමත්, සැලසුම්කරණය දී සැලකිය යුතු කරුණු පිළිබඳවත්, සැලසුම්කරණය සිදු විය යුතු වූ ආකාරය පිළිබඳ ව උදාහරණ සහිත ව විමසීමත් මෙහි දී සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

## විෂයමාලාව පිළිබඳ අර්ථකථන

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වය වන්නේ විෂයමාලාව යි. අධ්‍යාපනික අරමුණු හා අභිමතාර්ථ ඉටුකර ගැනීමට හා අරමුණු ඔවුන් තුළ ගොඩනැඟුණු ඉගෙනුම් ඵල බවට පරිවර්තනය කරනු පිණිස උපයෝගී කරගනු ලබන මාධ්‍ය, විෂයමාලාව යි. පාසලක පන්ති කාමරය තුළ ක්‍රියාත්මකවන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ සියලු ම ක්‍රියාකාරකම් විෂයමාලාවට ඇතුළත් වේ. විෂයමාලාව වනාහි විවිධාකාරයෙන් නිර්වචනය කරනු ලබන සංකල්පයකි. රටින් රටට මෙන් ම විෂයමාලාව සාකච්ඡාවට ලක් කරන විද්වතුන් අනුව ද ඒ පිළිබඳව අර්ථකථන ද වෙනස් මුහුණුවර ගන්නා බව ජයවීර මහතා සඳහන් කරයි.[1] එලෙෂ ම අග්‍රාවල් දක්වන්නේ විෂයමාලාව නිර්වචනය කිරීමට ද නො හැකි බවයි. නමුත් ඔහු තම කෘතියක දී නිර්වචන 79 ක් පමණ ඉදිරිපත් කොට ඇත.

එමනිසා විෂයමාලාව පිළිබඳ නිර්වචන විවිධත්වයෙන් යුතුව විශාල ප්‍රමාණයක් දැකිය හැකි ය. ඒ අනුව විෂය මාලාව සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් curriculum යන වචනයත්, එය ලතින් භාෂාවෙන් පැමිණි Currere යන්නෙන් ව්‍යුත්පන්න වූවක් බවත් බොහෝ අධ්‍යාපනඥයන්ගේ අදහස ය. Currere යන්නෙන් අදහස් වන්නේ ධාවන මාර්ගය, ධාවන පථය යන අදහස යි. ඒ අනුව විෂය මාලාව යනු කලින් තීරණය කරන ලද අරමුණු හා නිශ්චිත පරමාර්ථයන් සාක්ෂාත් කරගනු පිණිස, නිශ්චිත ගමන් මාර්ගයක් සහිත ධාවන පථයක් සේ දැක්විය හැකි විෂයානුබද්ධ ක්‍රියාවලියකි. විෂයමාලාව හැඳින්වීම සඳහා ජර්මන් භාෂාවෙන් didactic යනුවෙන් ද ප්‍රංශ භාෂාවේ දී වැඩසටහන් යන අර්ථය ලබා දෙන program යන්නෙන් ද භාවිත බව සඳහන් වේ.

විෂයමාලාව පිළිබඳ ව නිර්වචන ඉතා විශාල ප්‍රමාණයක් ඇති බවත්, පෝර්ටෙලි (1987) දි කළ ගවේෂණයේ දී එය 120ක් පමණ අධ්‍යාපනික සාහිත්‍යය තුළ දක්නට ඇති බවත් පෙන්වා දී ඇත. ඒ අතරින් නිර්වචන කිහිපයක් මෙසේ ගෙනහැර දැක්විය හැකි ය. විෂයමාලාව හඳුන්වන ඇලෙක්සැන්ඩර් දක්වන්නේ, (1852)

**"නිශ්චිත ජන සමූහයක් සඳහා පුළුල් හා සුවිශේෂී අරමුණු මුදුන් පත් කර ගැනීමේ අපේක්ෂාවෙන් ඉගෙනුම් අවස්ථා සම්පාදනය සඳහා සකස් කරන ලද සැලැස්මකි"**[2]

මෙයින් පැහැදිලි වන්නේ යම්කිසි අධ්‍යාපන ක්‍රමවේදයක් උදෙසා එය සාර්ථක කර ගැනීම සඳහා යම් අරමුණක් කරා ළඟා වීමට නම් විෂය මාලාවක් තිබිය යුතු බව යි. ඒ අනුව බලාපොරොත්තු වන අරමුණු සඳහා සකස් කරන ක්‍රමවේදයන්, විෂයමාලාව ලෙස මෙයින් පැහැදිලි කර දක්වයි.

විෂයමාලාව යනු කුමක්දැයි හඳුන්වන කේර් දක්වන්නේ,

**"මග පෙන්වීම සහ සැලසුම්කරණය යටතේ තනි තනි ව හෝ සාමූහික ව පාසල තුළ දී හෝ ඉන් පිටත දී ක්‍රියාත්මක කරනු ලබන සියලු ඉගෙනුම් අත්දැකීම් විෂයමාලාව යි"** [3] යනුවෙනි.

මෙයින් පැහැදිලි වන්නේ පාසලක් හෝ ඉන් පිටත දී හෝ කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව හෝ යම්කිසි ඉගෙනීමක් සඳහා සකස් කරනු ලබන, අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයන් විෂයමාලාව ලෙස හඳුන්වා තිබේ. මෙයින් පැහැදිලි වන්නේ කොහේ සිට හො ලබන සියලු ඉගෙනීම විෂයමාලාව වන බව යි.

Curriculum යන අදහසෙහි පිහිටා සිට condrad විසින් විෂයමාලාව අර්ථ දක්වන්නේ, **"ආරම්භයක් සහ අවසානයක් සහිත ව අනුපිළිවෙළින් සංවිධානය කරන ලද අත්දැකීම සමූහයක් ලෙස ය"**[4]

මෙයින් පැහැදිලි වන්නේ විෂය මාලාව තුළින් යම් ආකාරයකින් නිවැරදි ව ආරම්භයක් සහිතුහත් වන අතර ක්‍රමිකව ඉදිරියට පවත්වා ගෙන යාම සඳහාත් එය ඵලදායිතාවයෙන් යුතුව අවසානය වෙත ළඟා වීම සඳහාත් සිදුකරනු ලබන පියවරයන් සහිත ක්‍රමවේද සමූහයක් බව යි.

විෂයමාලා පිළිබඳ ව තවදුරටත් අදහස් දක්වන පී.එච්. ටේලර් දක්වන්නේ "විෂයමාලාව යන්නට විෂය කරුණු ඉගැන්වීමේ ක්‍රම අපේක්ෂණ අන්තර්ගතය ඒවායේ අන්තර් ක්‍රියාකාරීත්වය තුළින් සක්‍රිය විෂය මාලාවක් සකස් වේ"

පී.එච්. හර්ස්ට් (1972) දක්වන්නේ "විෂයමාලාව යනු අධ්‍යාපන අභිමතාර්ථ හෝ ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක වන පූර්වයෙන් සැලසුම් කළ ක්‍රියාකාරී වැඩසටහනකි." යනුවෙනි. මෙයින් පැහැදිලි වන පරිදි අධ්‍යාපනයක ඇතුළත් අරමුණු හා අභිමතාර්ථ ඉටු කරගැනීම සඳහා පූර්වයෙන් සකස් කරන ලද වැඩසටහන් සමූහය, විෂයමාලාවක් බව යි. එම වැඩසටහන් කිහිපයක් ලෙස විෂය කරුණු ඉගැන්වීමේ ක්‍රම ආදිය ඇතුළත් බව දක්වයි. එලෙෂ ම කේයි මේ පිළිබඳ ව අර්ථ දක්වන්නේ,

"විෂයමාලාව යනු ශිෂ්‍යයන්ගේ හැසිරීම් රටාවන් වෙනස් කිරීම සඳහා ඉගෙනුම් අත්දැකීම් සැලසුම් තුළ අඩංගු දෙය වේ" යනුවෙනි. බැරෝ විසින් විෂයමාලාව යනු කුමක්දැයි දක්වනුයේ, "ගුරුවරුන් විසින් ඔවුන්ගේ සහභාගීත්වයෙන් පන්ති කාමරයේ දී ශිෂ්‍යයන් විසින් ලබාගනී යැයි අපේක්ෂා කරන දැනුමට අදාළ ව කාලෝචිත ව සැලසුම් කරන ලද අධ්‍යාපන ක්‍රියාවලින් වේ"යනුවෙනි.[5]

උක්ත නිර්වචනයන්වලට අනුව ඇතැම් අවස්ථාවල දිශානතියකට ලඝු වන අතර තවත් නිර්වචනවලින් ඉතා පුළුල් ලෙස සංවර්ධනාත්මක ලක්ෂණ දක්වන බව හඳුනාගත හැකිය. මෙම සෑම විෂය මාලාවකින් ම අපේක්ෂා කරන කරුණු කිහිපයක් හඳුනාගත හැකි ය. කරුණු අපේක්ෂණ ඉටු කර ගැනීම උදෙසා විෂයමාලාව සකස් කරනු ලැබේ. කොලීජ්යේ දක්වනුයේ,

"විෂය මාලාව මගින් පුරුෂයකු ස්ත්‍රියක වඩා ඥානවන්ත, වින්දනාත්මක, කරුණාවන්ත, වගකිවයුතු, ප්‍රයෝජනවත්, ප්‍රීතිමත් පුද්ගලයකු බවට පත් කෙරේ. යනුවෙනි. මෙවැනි පුද්ගලයන් නිර්මාණය කිරීමේ අරමුණු ඇති ව සංවිධානය කරනු ලබන වැඩසටහන් විෂයමාලාව ලෙස හැඳින්විය හැකිය.

## සැලසුම්කරණය හා අධ්‍යාපන සැලසුම්කරණ සංකල්ප

යම්කිසි කාර්යයක සාර්ථකත්වය හා අසාර්ථකත්වය රඳා පවතින්නේ එහි සැලසුම්කරණය අනුවය. විශිෂ්ට සැලසුම්කරණයකින් යහපත් ප්‍රතිඵල ද ඉන් බාහිර ව අයහපත් ප්‍රතිඵල විඳීමට සිදු වන බව පැහැදිලි ය. සැලසුම්කරණය මගින් අපේක්ෂා කරන කාර්යය එලෙසම ඉටු කර ගැනීමට හැකියාව ලැබේ. සැලසුම්කරණය මගින් අපේක්ෂා කරනුයේ කුමක් ද? එහි පරමාර්ථ කවරේ ද? එහි අවසන් ප්‍රතිඵලය කුමක් ද? යන්න ඉතාමත් හොඳින් සැලසුම්කරණය තුළින් කළ යුත්තකි. නැතහොත් එහි අවසන් ප්‍රතිඵලය නිරර්ථක වූවක් ලෙස ඉදිරිපත් විය හැකි ය.

**"සැලසුම්කරණය වනාහි කිසියම් අපේක්ෂණයක ඒ සඳහා උපයෝගී කරගත හැකි යෝග්‍යතම ක්‍රියාමාර්ග අනුසාරයෙන් ළඟා කර ගැනීමට අනාගතයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා වන තීරණ ක්‍රියාමාර්ගයන් සකස් කිරීම පිළිබඳ ව ක්‍රියාවලියකි "**

සැලසුම්කරණය යනු යම් කාර්යයක් සිදු කිරීමට පෙර එය නිවැරදි ව කළ යුතු දේ තීරණය කිරීම යි. කරන කාර්යයේ අරමුණු පරමාර්ථ අපේක්ෂාවන් සහ එය ක්‍රියාවට නංවන පියවරයන් පිළිබඳව මුලින් තීරණය කිරීම, පියවර ගතකිරීම සැලසුම්කරණය යනුවෙන් හැඳින්විය හැකි ය. සෑම කාර්යකදී ම පාහේ විෂයමාලා සැකසීමේ දී ද මූලික ව සැලසුම්කරණය අත්‍යවශ්‍යය. නැතහොත් රටක අධ්‍යාපනය ජාතියක ඉරණම කුමන දිශාවකට ගමන් කරන්නේදැයි යන්න ගැටලු සහගත වේ. එම නිසා මූලික කාර්යන්හි දී මෙන්ම විෂය මාලාවේ දී ද සැලසුම්කරණය අත්‍යාවශ්‍ය ය.

කුම්බ්ස් අධ්‍යාපන සැලසුම්කරණ යනු කුමක්දැයි හැඳින්වීමේ දී ඔහු දක්වන්නේ **"සැලසුම්කරණය එහි පුළුල් අර්ථයෙන් ගත් කල සිසුන්ගේ හා සමාජීය අවශ්‍යතා සහ ඉලක්කවලට අනුරූපව වඩා ඵලදායි හා කාර්යක්ෂමව කිරීමේ අරමුණ ඇතිව අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලිය විචාරවත් හා ක්‍රමානුකූල විශ්ලේෂණයකට භාජනය කිරීම ය."**

යුනෙස්කෝ මගින් දක්වා ඇති නිර්වචනයට අනුව **"සැලසුම්කරණය යනු ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයන් විසින් සිසුන් තුළ ඇති**

කිරීමට බලාපොරොත්තු වන අරමුණු අධ්‍යාපන ක්‍රමය තුළට ගෙන ඒමයි. එය ගැටලුවලට විචාරවත් හා විද්‍යාත්මක ප්‍රවේශයකි. මෙවන් ප්‍රවේශයක් විසින් අරමුණු හා උපයෝගී කරගනු ලබන සම්පත් නිවැරදි ව හඳුනාගත යුතු ය. විකල්ප ක්‍රියා මාර්ගයන්හි ප්‍රතිඵල පරීක්ෂා කොට ප්‍රශස්ත ක්‍රියාමාර්ග තෝරා ගත යුතු ය. සුවිශේෂ කාල සීමාවන් තුළ ක්‍රියාත්මක කළ හැකි සුවිශේෂී ඉලක්ක තෝරාගත යුතු ය. අවසාන වශයෙන් ප්‍රශස්ත ක්‍රියාමාර්ග තෝරාගෙන ඒවා ක්‍රමානුකූල ව ක්‍රියාත්මක කළ යුතු යි.''ආදී ලෙසින් දක්වයි.[6]

මේ අනුව පැහැදිලි වන්නේ අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ දැනුම ඇති පුද්ගලයන් විසින් ශිෂ්‍යයා තුළ ඇති කිරීමට අපේක්ෂා කරන අරමුණු අධ්‍යාපන ක්‍රමය තුළට ගෙන ඒම, සැලසුම් කිරීම, විෂයමාලා සැලසුම වන බව යි. ඇති ගැටලු නිරාකරණය, ඇතිවිය හැකි ගැටලුවලට විසඳුම් ලබා දීමත් ආදි ප්‍රශස්ත ක්‍රියාමාර්ග ආශ්‍රයෙන් ශිෂ්‍යයාගේ ඉටු විය යුතු වූ සංවර්ධනය ඉටුකිරීමත් විෂයමාලා සැලසුම්කරණයෙන් සිදු වේ.

## සැලසුම්කරණයේ අවශ්‍යතාවය හා එහි වැදගත් කම

සාර්ථක සැලසුම්කරණයේ දී දැනුම ක්‍රම ශිල්ප හා කුසලතා පමණක් නො ව රටට අවශ්‍ය අධ්‍යාපනය කුමක්දැයි තෝරා ගැනීමේ ශක්තිය ද සැලසුම්කරණය සිදුකරන පුද්ගලයන් තුළ තිබිය යුතු යි. නැතහොත් රටේ අනාගතය පිළිබඳව දැඩි අනතුරුදායක බවක් ඇති විය හැකි බව පැහැදිලි වේ.


විෂයමාලා සැලසුම්කරණයක අවශ්‍යතාවය පිළිබඳව ද දැඩි ලෙස සඳහන් කළ හැකි ය. ඉඩකඩම් ප්‍රතිපත්තිය, ආහාර නිෂ්පාදනය හා කල් තබා ගැනීමේ ද්‍රව්‍ය රැස් කිරීම හා ගබඩා කිරීම සඳහා සැලසුම් හා මෙහෙයුම් අවශ්‍ය වේ. අධ්‍යාපනය මෙම සියලු කටයුතුවල පදනම විය යුතුය. විශේෂයෙන් ම මෙරට අර්ධ නාගරික හා ගම්බද නො දියුණු ප්‍රදේශයන්හි කරනු ලබන අධ්‍යාපන සැලසුම්කරණ තුළ මෙකී සංවර්ධන නැඹුරුව පිළිබිඹු විය යුතු ය. අධ්‍යාපනය පාසල යන සංකල්පයෙන් අත්මිදී මුළු සමාජය ම දැනුවත් කිරීමේ හා ජනතා සංවර්ධනයට අවශ්‍ය කුසලතා හා ආකල්ප ගොඩනැගීමේ මූලික ක්‍රියා මාර්ගයක් විය යුතු ය. අධ්‍යාපනය ගම නගරයට විකල්පයක් වශයෙන් සාමය, සතුට, සංවරය හා සෞභාග්‍යය අනුව ජීවත් විය හැකි සමාජයක් බවට පරිවර්තනය

කිරීමේ විප්ලවීය ක්‍රියාදාමයේ මූලික අත්තිවාරම විෂයමාලා සැලසුම්කරණය විය යුතු ය.

අධ්‍යාපන ක්‍රමයක් සංවිධානයේ දී පුද්ගලයාගේ පූර්ණ ස්වීයත්වය වර්ධනය කරගැනීමටත් ඔහුට ගමේ හෝ නගරයේ ඕනෑ ම තැනකට විචලනය වීමටත් ශක්තිය ලබා දිය යුතුය. අධ්‍යාපනය පුද්ගලයාගේ ශක්තිය හා අවශ්‍යතා අනුව ඔහුගේ පෞර්ෂ වර්ධනයට හා ක්‍රියාත්මක නිර්මාණශීලී හා කලාත්මක වර්ධනයට ප්‍රබලතම ආධාරකයක් විය යුතුය. විෂයමාලා ක්‍රමය විවිධ ප්‍රදේශයන්හි පරිභෝජනයක් හා නිෂ්පාදනයක් වශයෙන් එකිනෙකට වෙනස් තත්වයන් අනුව මෙන්ම ඔවුන්ගේ අභිප්‍රාය අනුව එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට සංක්‍රමණය වීමට අවස්ථාවක් පාදා දිය යුතු ය. අධ්‍යාපනය ප්‍රජානන, ආවේදනික හා මනෝචාලක යන ක්ෂේත්‍රයන් වර්ධනය කරන අතර ඉහත කී කරුණු ද සැලකිල්ලට යොමු කිරීම වැදගත් වේ. මෙය සැලසුම්කරණයේ දී පිරිමසාලිය යුතු අවශ්‍යතාවයකි.

## විෂයමාලා සැලසුම්කරණයේ දී අනුගමනය කළ යුතු මූලධර්ම

අධ්‍යාපන සැලසුම්කරණයේ දී අධ්‍යාපනඥයන් හා ගුරුවරුන් පමණක් එයට සහභාගි වීම ප්‍රමාණවත් නො වේ. විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ ව විශේෂඥයන් ද එයට සහාය කර ගත යුතුය. සියලුම සැලසුම්කරණයන්හි ඵලදායී සාර්ථක ක්‍රියාකාරීත්වය අවසානයේ දී ආර්මික සාධක මත රඳා පවතින බැවින් අනිවාර්යයෙන් ම මෙහි දී ආර්මික විශේෂඥයන්ගේ ද සහාය ලබා ගත යුතු වේ. විෂයමාලා ගොඩනැගීමේ දී පවා ඉතා වැදගත් බැව් පෙන්වා දිය හැකි ය. විෂයමාලා සැලසුම්කරණයේ දී සිදුවන කාර්යයන් පහත රූපසටහන ආශ්‍රයෙන් පැහැදිලි කළ හැකි ය.



මෙම ක්‍රියාවලියයටතේ යම්කිසි සැලසුම්කරණයක් නැවත ප්‍රතිසංස්කරණය, නැවත සැලසුම් කිරීම ආදිය සිදු කිරීම මගින් ඉතා යහපත් ක්‍රියාමාර්ග තෝරා ගැනීමට හැකියාව ලැබෙන බව සඳහන් කළ හැකිය. විෂයමාලා සැලසුම්කරණයේ දී ද මෙම ක්‍රියාවලිය සිදුවේ.

මේ සඳහා හේතු වන මූලධර්ම කිහිපයකි. විෂයමාලා පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශයයේ දී සඳහන් කරන කරුණු මෙන්ම විෂය මාලාව පිළිබඳව සංවර්ධනාත්මක ප්‍රවේශයේ දී සඳහන් කරන කරුණු ද දාර්ශනික මතවාදයන්ද ප්‍රවර්ධනාත්මක හා සංවර්ධනාත්මක ප්‍රවේශය ද මෙම මූල මූලධර්ම පිළිබඳව අවධානය යොමු කොට ඇත.

## සාම්ප්‍රදායික ප්‍රවේශය

විෂයමාලා සැලසුම්කරණය පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශයයේ දී සමාජයේ මුල් කාලයේ දී ගුරුවරයා විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි විෂයයක් හෝ විෂයයන් කිහිපයක් පමණක් ඉගෙනීම සිදුවිය. එය ගුරුවරයා කියන දෙයින් දේශන ක්‍රමයට ශිෂ්‍යයාට ඉගෙනීමට සිදු වී ඇත. මෙය ඒක දිශානතිය වූවක් බව පැහැදිලි වේ.

එලෙසම උගන්වන කරුණු සීමාසහිත වූ අධ්‍යාපන ඒකකයක් ලෙස පැරණි අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක විය. ස්ථිර නිශ්චිත දැනුම් ප්‍රමාණයක් ලබා දීමට අරමුණු වූ ක්‍රමයක් ලෙස සාම්ප්‍රදායික ප්‍රවේශයයේදී විෂයමාලාව හඳුන්වා ඇත. ඒ අනුව විෂය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීම නොව එක් විෂයක් පිළිබඳව සාමාන්‍ය දළ සීමා කරන ලද දැනුමක් ලබාදීම අපේක්ෂාව විය.

සම්ප්‍රදායික විෂයමාලාව ලෙස පුද්ගලයන් දක්වන්නේ යම්කිසි අරමුණක් සාක්ෂාත් කර ගැනීම උදෙසා දක්වන ලද ලිඛිත ලියවිල්ලක් බව ය. ඒ එම අරමුණ මුදුන් පමුණුවාලීම විනා පුළුල් දැනුමක් ලබාදීම සිදු නොවූ බව පැහැදිලි වේ. මෙලෙස සාම්ප්‍රදායික ප්‍රවේශයේ දී විෂය මාලාව පිළිබඳ මූලධර්ම කිහිපයක් දක්වනුයේ හුදෙක් පුළුල් වූ දැනුමක් ලබාදීමට නොව සංක්ෂිප්ත එක් අරමුණක් සහිත ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වීමයි. එලෙෂ ම මෙය ගුරු කේන්ද්‍රීය වූ අධ්‍යාපන ක්‍රමයක් බව දැක්විය හැකි ය. ඒවා සාම්ප්‍රදායික ප්‍රවේශය මූලිකාංග ලෙස පෙනේ.

## සංවර්ධනාත්මක ප්‍රවේශය මූලධර්ම

විෂයමාලාව ශිෂ්‍යයාගේ කැමැත්ත අනුව වෙනස්වන ඒ ඒ පාසල්වල නම්‍යශීලීත්වයට යොමුවන ඉතා දැඩි වූවක් නොව ශිෂ්‍යයාගේ සංවර්ධනය උදෙසා හේතුවන ලක්ෂණයන්ගෙන් යුක්ත වූවක් බව දක්වයි. සාම්ප්‍රදායික ප්‍රවේශයේ දී ගුරු කේන්ද්‍රීය පැවැත්වූ විෂය මාලාව සංවර්ධනාත්මක ප්‍රවේශයේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය විෂය මාලාවක් බවට පරිවර්තනය වී ඇති බව දැකිය හැකිය. ක්සිම ශිෂ්‍යයකු තව ශිෂ්‍යයකු හා සමාන නොවන බව ගුරුවරයා අවබෝධ කොටගෙන ඒ අනුකූලව විෂයමාලාව නම්‍යශීලී වූවක් බවට පත් විය යුතු බව මෙහි දී අවධානය යොමු වෙයි.

විෂයමාලාව ශිෂ්‍යයාගේ අභ්‍යන්තරිකව පෙළඹලඹීමක් ඇති වන ආකාරයෙන් සකස් විය යුත්තක් බව දැක්විය හැකිය. ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රමය අනුව ශිෂ්‍යයාගේ ප්‍රජානන, මනෝචාලක හා ආවේදන ක්ෂේත්‍ර සංවර්ධනය සිදු වේ. ඒ පිළිබඳව සංවර්ධනාත්මක ප්‍රවේශයේදී අවධානය යොමු කරයි. එලෙෂ ම එම ශිෂ්‍යයන් උපස්ථම්භනය වන ආකාරයට කිසියම් අනාගත ජීවිත යහපත් පැවැත්ම සඳහා ජීවිත අත්දැකීම්ලබා ලබා දීමේ අරමුණින් විෂය මාලාව සංවිධානය වන බව දැක්විය හැකිය. මෙම ප්‍රවේශයේ දී ඇගයීම සිදු කරනුයේ විෂයන්ගේ සාධන මට්ටම මැනීම සහ පෞරුෂ මට්ටමේ ගුණාංග තුළිනි. දැනුම, කුසලතා හා ආකල්ප ලබාගෙන ඇති ආකාරය පිළිබඳ ව මෙම සංවර්ධනාත්මක ප්‍රවේශයේ දී ඇගයීම තුලින් මනාව සිදු වේ. එය සංවර්ධන ප්‍රවේශය මූලික පරමාර්ථය බව සඳහන් කළ යුතු ය.

## සාරාර්ථවාදී දර්ශනය

ඇරිස්ටෝටල් වැනි දාර්ශනිකයන් සාරාර්ථ දර්ශනයේ දී අධ්‍යාපන විෂය මාලා සැලසුම්කරණය පිළිබඳ අවධානය යොමු කොට ඇත. ප්‍රධාන වශයෙන් ස්වභාවිකව හෝ භෞතික ව පවතින දෙයක එහි අනන්‍යතාවය තහවුරු කරන ආකාරයේ ගුණාංග කිහිපයක් පවතී යන්න මොවුන් ප්‍රකාශ කරයි.

විෂයමාලාව යනු ඊටම ආවේණික වූ ශික්ෂණයන් ගෙන් සමන්විත විෂයන්ගේ යුක්ත වූවක් බව දක්වයි. එලෙසම විෂය මාලාව මගින් සිදුකරනුයේ සැම ළමයෙකුට ම සමානව සැලකීම යි. ශිෂ්‍යයා සමාජ අනුයෝජනය කිරීම සිදුකළ යුතු වූවක් බව විෂයමාලා පිළිබඳ ව

සාරාර්ථවාදීන් ඉදිරිපත් කරයි. පුද්ගලයන් තුළ ශික්ෂණය ඇති කිරීම වඩා වැදගත් බවත් අධිකාරිවාදී ස්වරූපයක් දරන බව පෙනේ. ගුරුවරයාගේ කාර්යය ශිෂ්‍යයාට පැවරුම් ලබාදීමයි. ශිෂ්‍යයා ප්‍රජාතාන්ත්‍රිකව යමක් සිදුකිරීමට කටයුතු කළ නොහැකි බවත් විෂයමාලා වගේ ඒවා නැවත නැවත කියා දීම පමණක් ගුරුවරයා කළ යුතු බවත් සඳහන් කරයි. සංයුක්ත චින්තනය සාමාන්‍ය ජීවිතය තුළ යොදා ගන්නා ආකාරය සාරාර්ථවාදීන් ඉදිරිපත් කරයි. ඇගයීම ප්‍රමිතිගත පරීක්ෂණ මගින් සිදුවිය යුතු කාරණාවක් බව ඔවුහු විෂයමාලා පිළිබඳ හැඳින්වීමේ දී දක්වා ඇත. මෙම කරුණු වලින් මූලිකව සාරාර්ථවාදී ඉදිරිපත් කරන විෂය මාලාව පිළිබඳ මූලධර්ම හඳුනාගත හැකි ය.

මෙවැනි වූ මූලධර්ම උපයෝගී කරගෙන විෂයමාලා සැලසුම් කිරීම සඳහා අවකාශ ලබා ගත හැකි බැව් සඳහන් කළ හැකිය. එය උක්ත කරුණු තුළින් පැහැදිලි වේ.

## අධ්‍යාපන සැලසුම්කරණය

එලෙසම විෂයමාලා සැලසුම්කරණය පිළිබඳ ව පොදු ආකෘති කිහිපයක් දැකිය හැකි ය. ඇතැම් අවස්ථාවලදී කරුණු හයක් සලකා බැලිය යුතු බව දක්වයි.

1. හැඳින්වීම
2. අරමුණු හා පරමාර්ථ
3. විෂය කරුණු ඉගෙනීම් හා අත්දැකීම්
4. ඉගැන්වීමේ ක්‍රම
5. ඇගයීම්
6. මූලාශ්‍ර

ඇතැම් තැනක මූලිකාංග හතරක් පමණක් දක්වා ඇත.

1. අරමුණු හා පරමාර්ථ
2. විෂය කරුණු / ඉගෙනීමේ අත්දැකීම්
3. ඉගෙනීමේ ක්‍රම
4. ඇගයීම්


මෙම මූලික අංග හතර විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියේ දී උපයෝගී කරනු ලබන මූලික ප්‍රශ්න හතරකට මඟ පෙන්වනු ලබයි. එනම්,

1. මෙම විෂයමාලාව කුමක් සඳහා ද?
2. කවර විෂය කරුණු භාවිත කළ යුතු ද?
3. කවරක් මේ ඉගෙනීමේ අත්දැකීම් හා පන්ති සංවිධාන ක්‍රම යොදා ගත යුතු ද?
4. ප්‍රතිඵලය විය යුත්තේ කෙසේද? යන ප්‍රශ්නයන් ය.

## අරමුණු හා පරමාර්ථ

විෂයමාලා සැලසුම්කරණයේ දී මූලිකව විෂයමාලාව සැලසුම් කිරීමට හේතුවන පරමාර්ථ සහ අරමුණු නිගමනය කිරීම අත්‍යාවශ්‍ය ය. විෂයමාලාව සැලසුම් කිරීමේ දී අනුගමනය කළයුතු අරමුණු තුනක් ඉදිරිපත් කරයි. ප්‍රජානන, මනෝචාලක හා ආවේදන ක්ෂේත්‍ර මෙම අරමුණු අතරට අයත් වේ. විෂම අදහස්වලට ගැලපෙන අයුරින් අරමුණු සරල අවස්ථාවේ සිට සංකීර්ණ අවස්ථා දක්වා පියවරෙන් පියවර ඉදිරිපත් කර ඇත. මෙලෙසින් අධ්‍යාපන සැලසුම්කරණයට මත්තෙන් අරමුණු කවරේ ද, යන්න මූලික ව හඳුනාගත යුතුය. විෂයමාලා අරමුණු ශිෂ්‍ය කේන්ද්‍රිය විය යුතුය. ඒ සඳහා මූලාශ්‍ර වශයෙන් සැලකිය යුතු කරුණු වර්ගීකරණයක් වශයෙන් රූප සටහනක් මගින් එය රොන්ට්‍රි පැහැදිලි කර දක්වයි.

1. සමාජමය පුද්ගලයන්ගේ අනාගත අවශ්‍යතා පිළිබඳව බලාපොරොත්තුව.
2. විෂය විශේෂඥයින්ගේ වෘත්තිය විශේෂඥයින්ගේ සහ වෙනත් විශේෂඥයින්ගේ ක්‍රියාවලින් විශ්ලේෂණය.
3. මානව දැනුම් සහ විෂය කරුණු ව්‍යුහය විශ්ලේෂණය කිරීම[7].



මෙලෙසින් විෂයමාලා සකස් කිරීම සඳහා අරමුණු හා පරමාර්ථ අවශ්‍යවන අතරම ඊට අමතරව ශිෂ්‍යාගේ සමාජ විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක, ශාරීරික සහ චිත්තවේගීය වර්ධනය ගැන ද විෂයත්ගේ ස්වභාවය ගැනද පාරිභෝගිකයන්ගේ වෘත්තීයමය හා කර්මාන්තමය අවශ්‍යතා ගැන ද සැලකිය යුතුයි. හෝල් කරුණු හතක් ඉදිරිපත් කරමින් අරමුණු තීරණය කිරීමේදී වැදගත් මූල මූලධර්ම දක්වයි.

1. විෂය කරුණු
2. ශිෂ්‍ය අවශ්‍යතා
3. ගුරු අවශ්‍යතා
4. වෘත්තීය සංවිධාන වැනි බලවේග
5. සාමාන්‍ය අධ්‍යාපන අරමුණු සහ පරමාර්ථ
6. අධ්‍යාපන මනෝවිද්‍යාව
7. අධ්‍යාපන දර්ශනය[8]

මෙයින් පැහැදිලි වන්නේ විෂය මාලා සැලසුම්කරණය සඳහා අරමුණු හා පරමාර්ථ සහ උක්ත කරුණු පිළිබඳව ද අවධානය යොමු විය යුතු බවයි.

**විෂය කරුණු / ඉගෙනීමේ අත්දැකීම්**

විෂයමාලාව සම්පාදනය කරන්නන් පළමුවෙන් පරමාර්ථ හා අරමුණු නැතහොත් නිපුණතා නිශ්චය කර ගැනීමෙන් අනතුරුව කවර විෂය කරුණු හෝ ඉගැන්වීම් අත්දැකීම් පාවිච්චි කළ යුතු දැයි සැලකිල්ලට ගෙන බැලිය යුතු වේ. විෂය කරුණු රැස්කිරීම විෂය කරුණු තේරීම් හා ඒවා පිළිවෙළටකට සංවිධානය කර ගැනීම ද මනා සැලකිල්ලකින් කළ යුතු වේ.

අදාළ විෂය මාලාවට ඇතුළත් කළයුතු කරුණු පිළිබඳව මෙහිදී අවධානය යොමු වේ. අරමුණු හා අභිමතාර්ථ සාධනය කරගනු පිණිස ඇතුළත් කළයුතු ගිණුම් කරුණු පිළිබඳ ව මෙම පියවරේ දී කරුණු ඇතුළත් කළ යුතු ය.

මේ සියළුම කාර්යයන්හී දී උගන්වන සිසුන්ගේ මට්ටම තේරුම් ගත යුතුයි. මෙසේ කරුණු මෙන්ම ශිෂ්‍ය පරිසරය හා ගැටීමෙන් ලබාගන්නා අත්දැකීම් ද ඉගෙනීමේ දී බොහෝ දුරට උපකාරී වේ. මෙම ඉගෙනුම් අත්දැකීම් විෂයමාලාවට සම්බන්ධ කරගත හැකි ආකාරය ද විෂයමාලා

සැලසුම්කරුවන් විසින් සැලකිල්ලට ගැනීම වැදගත් ය. විවිධ මාධ්‍යයන් මගින් ලබන අත්දැකීම් යහපත් ඉගෙනුම් ඵල ලබා ගැනීම සඳහා විෂයමාලාව එක්තැන් කර ගැනීමට ඉඩකඩ ලබා දිය යුතු ය.

**ඉගෙනීමේ ක්‍රම**

මෙම පියවරේ දී අරමුණුවලට සකසාගත් ඉගෙනීම් කරුණු වෙත ළඟා කරවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රම පිළිබඳව අවධානය යොමු කෙරේ. ශිෂ්‍යයාට ගැළපෙන ආකාරයෙන් ශිෂ්‍යාගේ වයස් මට්ටම් අනුව අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි ඉගනීමේ ක්‍රම සංවිධානය කළ යුතුයි. කවර අන්දමට ඉගැන්විය යුතු ද කවර ක්‍රම භාවිතා කළ යුතු දැයි නිගමනය කිරීමට මෙහිදී අවස්ථාව එළඹ ශිෂ්‍යා පිළිබඳව මනෝවිද්‍යාත්මක විමසීමක් මෙහිදී සිදු කිරීම අවශ්‍ය වේ. පරමාර්ථ හා අරමුණු තීරණය කිරීමේදීත් විෂය කරුණු ඉගෙනීම් අත්දැකීම් තේරීමේ දීත් දර්ශනය, සමාජ විද්‍යාව හා මනෝ විද්‍යා යන විෂයන්ගේ බලපෑම ලැබේ. ගුරුවරු උගන්වන විෂයට අනුව ම ඉගැන්වීම් ක්‍රම වෙනස් වීම් සිදුවිය හැකිය. නමුත් ඒ සඳහා ඉතාම යෝග්‍ය අදාළ ක්‍රම තෝරා ගැනීමට විෂයමාලාව තුළින් ඉඩකඩ ලැබීමට නම් මෙම අවස්ථාවේ දී ඒ සඳහා අවශ්‍ය කරන තොරතුරු තීරණය කළ යුතු ය.

ගුරු ශෝල සබඳතාව රැකෙන පරිදි අදාළ විෂය කරුණු ඉතාමත් උචිත අන්දමට ශිෂ්‍යයාට ලබාදිය හැක්කේ කෙසේ ද ඉගැන්වීමේ ක්‍රම මගින් සළකා බැලිය යුතු යි. මෙසේ උචිත ඉගැන්වීම් ක්‍රම හා පන්ති සංවිධානයනය කිරීමේ ක්‍රම තීරණය කළ යුත්තේ පලමු පියවර (2) ගැනීමෙන් පසුව ය. ප්‍රායෝගික ක්‍රම, සාකච්ඡා කිරීමේ ක්‍රම, විෂය ඇගයීම් ක්‍රම ආදිය සංවිධානය කළ යුතු යි.

**ඇගයීම**

විෂයමාලා සම්පාදනයේ දී සැලකිල්ලට ගතයුතු අනික් මූලික අංගය වන්නේ ඇගයීමය. මේ දේ ප්‍රධාන වශයෙන් විෂයමාලාවේ සාර්ථකත්වය අසාර්ථකත්වය විමසා බැලීමට හැකියාව ලැබේ. මුලින් දක්වන ලද පරමාර්ථ හා අරමුණු කොතෙක් දුරට මුදුන්පමුණුවා ගත්තේ ද ළඟා කර ගත්තේ ද යන්න සොයා බැලිය හැක්කේ ඇගයීම මගිනි.

ඇගයීම සඳහා පූර්ණ පද්ධතියක් අනුගමනය කළ යුතු වේ. ඒ සඳහා ලිඛිත පරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, දෛනික වාර්තා, අඛණ්ඩ ඇගයීම, පැවරුම් ආදි උපකාර කරගත හැකි ය. මෙම පූර්ණ ඇගයීම් පද්ධතියකින් නිපුණතා කරා ළඟා වීම හැකි දැයි විමසා බැලිය යුතු ය. මෙම ඇගයීම් මගින් විෂයමාලාවක වටිනාකම් ශක්‍යතා ක්‍රියාත්මක කළ හැකි බවත් දුර්වලතා හා ප්‍රතිඵල සහ සීමාවන් අඩුපාඩු යන අංග ගැන ද සැලකිල්ලට ගනු ලැබේ. මේ අනුව පෙනී යනුයේ විෂය මාලාවක් ගැනීම මගින් බලාපොරොත්තු වන ප්‍රතිඵල සාර්ථක ද නැද්ද යන්න මැන බැලීමට ඇගයීම බෙහෙවින්ම උපකාරී වන බවයි. මුල දී ඇති කරගනු ලබන පරමාර්ථ කොතෙක් දුරට මුදුන් පමුණුවා ගතහැකි ද? කොතෙක් දුරට මුදුන් පමුණුවා ගනු ලැබුවේ ද? යන්න සොයා ගත හැකි වනුයේ මෙසේ විෂයමාලාව නිරන්තරයෙන් ඇගයීමට ලක් කිරීමේ දී ය. එහි දී ඉතා සාර්ථක විෂයමාලාවක් ලෙස සැලසුම් කිරීමට මූලික ව හැකියාව ලැබෙන බව සඳහන් කළ යුතු ය.

මෙලෙසින් විෂයමාලාවක් සැලසුම් කිරීමේ දී මූලිකව ම පරමාර්ථ හා අරමුණ තීරණය කිරීම විෂය කරුණු ඉගෙනීමේ අත්දැකීම් හෙවත් අන්තර්ගතය තීරණය කිරීම, ඉගැන්වීමේ ක්‍රම තීරණය කිරීම, එම ක්‍රම මගින් සියල්ල සිදු වේ. සියලු අරමුණු සාක්ෂාත් කරගත හැකි ද යන්න හඳුනා ගැනීමට ඇගයීම සිදු කිරීම මගින් ඉතාමත් වටිනා විෂයමාලාවක් සකසා ගැනීමට අවකාශ ලැබේ. එම නිසා විෂයමාලාව සැලසුම් කිරීමේ දී මූලිකව මෙම සාධක හතර කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. ඒ අනුව විෂයමාලා සැලසුම්කරණය යනු කුමක් ද යන්න හඳුනා ගත හැකි ය.

**විෂයමාලා සැලසුම්කරණය සඳහා නිදසුන්:** ㅇ

**නිදසුන 1 :- පරිසර විෂය සැකසීම සැලසුම්කිරීමේ දී,**

අරමුණු හා පරමාර්ථ :-

1. පරිසරය ආරක්ෂා කරන පුද්ගලයෙක් බවට ශිෂ්‍යයා පත්කිරීම.
2. පරිසරය පිළිබඳව අනෙක් පුද්ගලයන් දැනුවත් කරන දැනුමක් ඇති පුද්ගලයෙකු වීම.
3. පරිසරය සම්බන්ධ වෙනත් ගෝලීය තත්ත්වයන් හා වැදගත්කම් පිළිබඳව දැනුවත් කිරීම.

**විෂය කරුණු හා අන්තර්ගතය:-**

පරිසරය හැඳින්වීම පරිසරයේ වටිනාකම පිළිබඳව අවබෝධයක් ලබාදීම.

පරිසර විනාශය පිළිබඳව අවධානය යොමු කිරීම.

පරිසරය පිළිබඳව සමාජය දැනුවත් කරන ආකල්ප සංවර්ධනය කිරීම.

**ඉගෙනීමේ ක්‍රම:-**

ප්‍රායෝගික පරීක්ෂණ පරිසරය පිළිබඳව කිරීම.

විනාශ වන ස්ථානය නැරඹීමට ක්ෂේත්‍ර චාරිකා ආදිය සූදානම් කිරීම.

විශේෂඥ දැනුම ඇති පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීම.

පාර්ශවික කරුණු පිළිබඳ දේශන මාලා පැවැත් වීම.

**ඇගයීම:-**

මෙම විෂයමාලාව සාර්ථකද අසාර්ථක ද විමසීම් සඳහා එහි ගුණදොස් විමසීම් සිදුකළ යුතුය. ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන්, ආකල්ප විමසීමෙන්, විභාග මගින්, ව්‍යුහගත රචනා මඟින්, සාකච්ඡා මාර්ගයෙන් ආදී වශයෙන් සිදුකළ හැකිය.

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ විෂයමාලා සැලසුම්කරණය පිළිබඳ ව ඉතා මනා අවබෝධයක් එය සකස් කරන්නාට තිබිය යුතු බවයි. එලෙස මෙම කරුණු සම්පූර්ණ ව සිදු කරන්නේ නම් ඉතා හොඳ විෂය මාලාවක් සැලසුම් කිරීමට හැකියාව ලැබෙන බව දැක්විය හැකි ය.

**නිදසුන 2 :- ශාරීරික අධ්‍යාපනය විෂය සැලසුම් කිරීමේදී,**

**අරමුණු:-**

යහපත් සෞඛ්‍යයක් ඇති කිරීම.

නිරෝගී පුද්ගලයයෙක් බිහි කිරීම සෞඛ්‍යය ඇති වැදගත්කම සම්බන්ධව දැනුම් ලබා දීම.

සෞඛ්‍යය අහිමි පුද්ගලයන්ගේ ඇති දුර්වලතා හඳුන්වා දී ඒවායින් මිදීමට උපස්ථම්භනයක් ලබා දීම.

**අන්තර්ගතය:-**

සෞඛ්‍ය නිර්වචනය කිරීම.

සෞඛ්‍යයේ ප්‍රධාන කොටස් පිළිබඳව අවබෝධ කිරීම.

සෞඛ්‍ය ඇතිකිරීමේ වැදගත්කම හඳුන්වාදීම.

සෞඛ්‍ය දුර්වලතා හඳුන්වාදීම. (රෝගාදිය)

සෞඛ්‍ය සම්බන්ධ සමාජ ආකල්පය වර්ධනයට හුරු කිරීම.

**ඉගැන්වීමේ ක්‍රම:-**

දේශන ක්‍රම මගින් කරුණු අවබෝධය.

රෝහල් ආදී ක්ෂේත්‍ර චාරිකා තුළින් අධ්‍යයනය කිරීම.

විශේෂඥ පුද්ගලයන් සමග සාකච්ඡාවලට යොමු කිරීම.

ප්‍රායෝගිකව සැසි ක්‍රියාත්මක කිරීම.

**ඇගයීම්:-**

විෂයමාලාව සාර්ථක අසාර්ථක දැයි හඳුනා ගැනීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණ විභාග නිබන්ධ අදහස් සහ ආකල්ප විමසීම සාකච්ඡා ආදිය සිදු කිරීම මගින් ඇගයීම සිදු කළ හැකි ය.

මෙම නිදසුන් ආශ්‍රයෙන් විෂයමාලා සැලසුම්කරණය යනු කුමක්ද යන්න ඉතාමත් හොඳින් පැහැදිලි වේ. විෂයමාලාවක් නිර්මාණය කිරීමට මත්තෙන් සැලසුම් කිරීමේ දී උක්ත ප්‍රධාන කරුණු හතර මූලික කරගෙන ඉදිරිපත් කිරීම් මගින් එය ඉතා හොඳ විෂය මාලාවක් බවට පත්කළ හැකි බැව් හඳුන්වා දිය හැකියි. අරමුණු තුළින් විෂයමාලාවේ දිශානතිය විෂය කරුණු තුළින් තහවුරු කිරීමක් ඉගෙනීම් ක්‍රම තුළින් ඒ ශිෂ්‍යයා තුළ ස්ථාවර කරන ආකාරයත් තුළින් ශිෂ්‍යයා එය ලබාගෙන ඇති ආකාරයත් හඳුනාගත හැකි ය. මෙලෙසින් විෂයමාලා සැලසුම්කරණය යනු කුමක් ද යන්න පැහැදිලි වේ.

## විෂයමාලා සැලසුම්කරණය සඳහා ආකෘති

ඉහත කී මූලිකාංග (4) මූලික කොටගෙන ඊට වඩා විශේෂ වූ අංග අන්තර්ගත කොට විෂයමාලා විශේෂඥයන් විසින් විෂයමාලා ආකෘතිය සකස් කර ඇත. සෑම රටක ම අධ්‍යාපනඥයන් විසින් තම විෂයමාලා සැකසීමේ දී විෂයමාලා ආකෘති අනුගමනය කරනු ලබයි. විෂයමාලා සැලසුම් කිරීමේ දී ඉතාම උචිත ක්‍රමය වනුයේ කිසියම් ආකෘතියකට අනුව එය සැලසුම් කිරීම යි.

විෂයමාලා ආකෘතිය ඉදිරිපත් කළ අය අතර වඩාත් ප්‍රකට අය වනුයේ **රැල්ෆ් ටයිලර්, වී. කේ. ඩීලර්, ඩෙනිස්ලෝටන්, හැලිවෙල් හා බර්ය.** මෙම ආකෘති සැලසුම්කරුවන්ගේ රටාවන් අනුගමනය කිරීමෙන් විද්‍යාත්මක විෂයමාලාවක් සකසා ගැනීමට හැකි ය.

කවර ආකෘතිය වුව ද අවම වශයෙන් ඉහත සාකච්ඡා කර මූලිකාංග පරමාර්ථ 4 වන පරමාර්ථ හා අරමුණු, විෂය කරුණු ඉගැන්වීමේ ක්‍රම, තක්සේරුකරණය හා ඇගයීම අන්තර්ගත විය යුතු වේ.

➢ රැල්ෆ් ටයිලර්ගේ ආකෘතිය (1875)


මොහු ඉදිරිපත් කළ ආකෘතිය අංග හතරකින් සමන්විත ය.

1. **පරමාර්ථ හා අරමුණු තෝරාගැනීම සංවිධානය කළ හැකි නිපුණතා තීරණය කිරීම.**
2. **විෂය කොටස් හා අත්දැකීම් තේරීම.**
3. **ඉගැන්වීම සඳහා සංවිධානය කිරීම.**
4. **තක්සේරු කිරීම හා ඇගයීම්.**

යන කරුණු හතරකින් සමන්විත ව ඔහු ඉදිරිපත් කොට ඇත.

➢ ඩී. කේ විලර්ගේ ආකෘතිය (1812)

මෙහි දී මොහු අංග පහකින් යුත් ආකෘතියක් දක්වයි. එය ක්‍රියාවලියක් ආකාරයෙන් සිදුවීම දැකිය හැකි ය.





➤ **කර්ගේ ආකෘතිය (1815)**

විෂයමාලා න්‍යාය පිළිබඳ සංකීර්ණ හා විස්තර සහිත ආකෘතියක් ගොඩනගා ඇත. කගේ ශමල්කා ආකෘති ලෙස හැඳින්වෙන්නේ එය යි. එය පියවර 4 කින් සමන්විත ය.

1. අරමුණු
2. දැනුම
3. පාසල් ඉගෙනුම් අත්දැකීම
4. ඇගයීම

යන අවස්ථා හතර මූලික කරගෙන තම ආකෘතිය සකසා ඇත්තේ මෙසේ ය.



මෙහිදී සෑම සංකල්පයක් ම එකිනෙක සම්බන්ධ වී පවතින බව පෙනේ. විෂමයමාලා සැලසුම්කරණය සඳහා යොදාගත හැකි අකෘති උක්ත සඳහන් ආකෘති අනුව පැහැදිලි වෙයි. සෑම ආකෘතියක ම පාහේ පළමුව සඳහන් කරන ලද පොදු ආකෘතික ලක්ෂණ අන්තර්ගතව පවතින බව පැහැදිලි වේ. සෑම විෂය මාලාවක් ම සැලසුම්කරනු ලබනුයේ යම්කිසි ආකෘතියක් අනුගමනය කරමිනි. එලෙසින් සකසන ලද විෂය මාලාව ඉතා සාර්ථක විෂයමාලාවක් බවට පත් කළ හැකි බැව් දැක්විය හැකි ය.

## විෂයමාලාවක් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු

විෂයමාලා සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු කිහිපයක් වේ. නැතහොත් එම සැලසුම් කරන විෂය මාලාව අර්ථ ශූන්‍ය අපේක්ෂා භංගත්වයෙන් යුක්ත වූ විෂයමාලාවක් බවට පත්වීමට ඉඩ ඇත. එම නිසා පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතු යි.

I. විෂයමාලා සකස් කරන්නේ කවුරුන් උදෙසා ද මෙහි දී,

1. ළමයින්ගේ වයස් මට්ටම
2. බුද්ධි මට්ටම
3. අවශ්‍යතා
4. ලැදියා

ආදිය සලකා බැලිය යුතු ය.

II. සමාජ අවශ්‍යතාවඃ-

1. රටේ අවශ්‍යතා
2. සමාජ අවස්ථා
3. ආර්මික හා සමාජ සංවර්ධනය

ආදිය ගැන අවධානය යොමු කළ යුතු ය.

III. ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන සම්පත්ඃ

1. පුද්ගලයන්
2. උපකරණ
3. සේවා භාණ්ඩ ආදිය

**IV. සකසන්නේ කවුරුන්ද:**

1. **අදාළ විශේෂඥ සේවා**
2. **සම්පත් පුද්ගලයන්** ගැන සැලකිය යුතු ය.

**V. වියදම**

**VI. ප්‍රතිලාභ**

විෂයමාලා සකස් කිරීමේ දී මෙම උක්ත කරුණු පිළිබඳව අවධානය යොමුකරමින් සැලසුම් කිරීම පළමුව කළ යුතු ය. එය සාර්ථක විෂය මාලාවක් සකසා ගැනීමේ මූලික පියවර වේය යන්න ඉහත සඳහන් සනිදර්ශන කරුණුවලින් මනාව පැහැදිලි වේ.

## සමාලෝචනය

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වය වන්නේ විෂයමාලාවයි. ඉගෙන ගන්නා දෙයෙහි අරමුණු සහගත බවක් අපේක්ෂා සහගත බවක් ඇති කිරීමට විෂයමාලාව සමත් වේ. එය විෂයමාලාව අවසානයේ දී රටට වැඩදායි ජාතියට වැඩදායී පුද්ගලයෙකු බිහි කිරීමට සමත්කමක් දක්වන්නක් බව පැහැදිලි වේ.

විෂයමාලාව නිර්වචනය කිරීම අපහසු ය. එයට හේතුව විෂයමාලාව යනු ක්‍රමයෙන් ක්ෂණිකව වෙනස් වන්නා වූ ගතික ලක්ෂණයන්ගෙන් යුක්ත වූවකි. එම නිසා විෂය මාලාව යනු කුමක් ද යන්න සරලව හැදින්වීමේ කටුක කාර්යය විද්වත් මතයන් ආශ්‍රයෙන් සිදුකරන ලදී. දිශානති සහගත බවක් නැති ආකාරය පැරණි අදහසේ දී හඳුනාගත හැකි නමුත් වර්තමාන නූතන අදහස් පුළුල් දිශානතියක් සහිත ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බව විෂයමාලාව නිර්වචනය කරන ලද විද්වත් නිර්වචන ආශ්‍රයෙන් පැහැදිලි ව දක්වා ඇත. ඒ අනුව විෂය මාලාව යනු ආරම්භයක් හා අවසානයක් සහිත කාලානුරූප ව වේ. වෙනස් කළ හැකියි. පුද්ගලික ව හෝ සාමූහිකව ඉගෙනුම් අපේක්ෂාවන් කරා ළඟා කරවන ක්‍රමවේදයන්ගෙන් යුක්ත වූවක් බව දැක්විය හැකි යි.

යම්කිසි කාර්යයක් හෝ විෂයමාලාවක් සැකසීමට මත්තෙන් එය සැලසුම් කිරීම මූලික ව සිදු කළ යුතු ය. නැතහොත් එයින් සිදුවන අනර්ථය ඉතා විශාල ය. ඒ පිළිබඳ ව උක්ත කරුණු තුළ දී අවධානය යොමු කෙරිණි. තව ද විෂයමාලා සැලසුම්කරණය සඳහා යොදාගත්

හැකි ආකෘති, විෂයමාලා සැලසුම්කරණයේදී අවධානය යොමු කළ යුතු කරුණු, විෂයමාලා සැලසුම්කරණයේ වැදගත් කම් ආදි වූ කරුණු රාශියක් පිළිබඳව නිබන්ධය තුළ දී සාකච්ඡාවට භාජනය කෙරිණි. එය දක්වන ලද නිදසුන් ආශ්‍රයෙන් විමසන කල්හි පැහැදිලි වන්නේ සැලසුම්කරණය ඉතාමත් අත්‍යවශ්‍ය වූ සාධකයක් බවයි. එයින් විෂයමාලාව දිශානතියක් සහිත අරමුණු මුදුන් පමුණුවාලිය හැකි අපේක්ෂා සහගත ලෙස විෂයමාලාවක් බවට පත් කිරීමට මූලික පසුබිමක් සපයන බව සඳහන් කළ හැකි ය.

ඒ අනුව මෙමඟින් විෂයමාලාවක් යනු කුමක් ද යන්න නිර්වචනය කිරීමත් විෂයමාලා සැලසුම්කරණය හැඳින්වීම සඳහා සෝදාහරණව කරුණු පැහැදිලි කිරීමක් සිදුකරන ලදී. එයින් ඉතාමත් පැහැදිලිව විෂය මාලාව හා සැලසුම්කරණ යනු කුමක් ද යන්න අවබෝධ කොට ගත හැකි ය.

## ආන්තික සටහන්


1. තිලකරත්න බණ්ඩා, ඩී. එම්. අධ්‍යාපන තාක්ෂණ විද්‍යාව. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2007, 92 පිටුව.
2. දිසානායක, එම්. ඩබ්ලිව්. ඩබ්ලිව්. අධ්‍යාපනය. කොළඹ විශ්වවිද්‍යාලය: ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමය, 2001, 56 පිටුව.
3. මුණසිංහ, උපාලි චන්ද්‍රසිරි. විෂයමාලා සංවර්ධනය. කොට්ටාව: සාර ප්‍රකාශන, 2018. 28 පිටුව.
4. සේනාධීර, සිල්වි. ශිෂ්‍ය නිර්මාපී බව සංවර්ධනය සඳහා පාසල් අධ්‍යාපන සැලසුම්කරණය. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005, 160 පිටුව.
5. සේනාධීර, සිල්වි. ලංකාවේ විශ්වවිද්‍යාල ශාස්ත්‍ර පීය විෂයමාලා ප්‍රතිසංස්කරණ අවශ්‍යතා. කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2001, 10 පිටුව.
6. හෙට්ටිආරච්චි, කුමාරදාස. අධ්‍යාපන කළමණාකරණයේ නව ප්‍රවණතා. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සටෙහෝදරයෝ, 2000, 56 පිටුව.
7. හෙට්ටිආරච්චි, කුමාරදාස. අධ්‍යාපන සැලසුම්කරණය හා ශිෂ්‍ය ව්‍යාපෘති. කොළඹ10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 1998, 12 පිටුව.
8. හෙට්ටිආරච්චි, කුමාරදාස. විසි එක්වන ශතවර්ෂය සඳහා අධ්‍යාපනය. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සටෙහෝදරයෝ, 1998, 88 පිටුව.